A

AL/2016/44/S-I 0800

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2016**

| | | |
|---|---|---|
| ඉස්ලාම් I<br>இஸ்லாம் I<br>Islam I | **44 S I** | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොද දක්වන්න.**

**1.** පළමු වරට ඉස්ලාම් ධර්මය ගැන ප්‍රචාරය සිදු වූ කන්ද,
(1) හිරා ය. (2) සෆා ය. (3) මර්වා ය. (4) අරෆා ය. (5) සබීර් ය.

**2.** 'මුවත්තා' නම් ග්‍රන්ථයේ කර්තෘ අභාවයට පත් වූ ස්ථානය,
(1) මක්කාව ය. (2) කූෆා ය. (3) තිමිෂ්ක් ය. (4) මදීනා ය. (5) බසරා ය.

**3.** ඉස්ලාමීය ඉතිහාසයේ අකීදා පිළිබඳ විවිධ කොටස් බිහි විය. ඒවායින් මුලින් ම බිහි වූ කොටස,
(1) අෂ් අරිය්‍යා ය. (2) ෂීආ ය. (3) මුඃතසිලා ය. (4) කාවරිජ්වරු ය. (5) වහ්දතුල් වුජූද් ය.

**4.** පහත දැක්වෙන සලාතවලින් කුත්බා දේශනය සිදු **නොවන** සලාතය,
(1) ජුම් ආ ය. (2) ඉස්තිස්කා ය. (3) ඊතයින් ය. (4) තෂ්බීහ් ය. (5) කුසූෆයින් ය.

**5.** ජල ධාරා ගලා යන ශ්‍රී ලංකාවේ ස්වාභාවික අලංකාරය දුටු අරාබිවරු එයට තැබූ නම,
(1) සෙරන්ඩිබ් ය. (2) තප්‍රබේන් ය. (3) අස්-සයිලාන් ය. (4) සිලෝන් ය. (5) අල් ජසීරා ය.

**6.** මස්ජිදයේ සිදුවන ක්‍රියාවලින් නබි සල් (තුමා) විසින් කර පෙන්වා දී ඇති වැදගත් ම ක්‍රියාව,
(1) සලාතය ඉටු කිරීම ය. (2) අල්-කුර්ආනය පාරායනයයි. (3) ඉගෙන ගැනීමයි.
(4) ඉඃතිකාෆ් රැකීමයි. (5) දික්ර් කිරීමයි.

**7.** අජ්නබි වූ කාන්තාවක් සමඟ තනිව සිටීම,
(1) මක්රූහ් ය. (2) ජා ඉස් ය. (3) මන්තූබ් ය. (4) හරාම් ය. (5) මුස්තහබ් ය.

**8.** මුජ්තහිද් කණ්ඩායමක් කිසියම් ගැටලුවක් සම්බන්ධයෙන් මතයක් ඉදිරිපත් කළ විට, එය අන් කිසිදු මුජ්තහිද් කෙනකු විසින් ප්‍රතික්ෂේප නොකර හෝ අදහස් නොදන්වා සිටින අවස්ථාවක ඇති වනුයේ,
(1) ඉජ්මා ෂරීහ් ය. (2) ඉජ්මා සුකූති ය. (3) ඉජ්මාඅක්සරිය්‍යා ය. (4) ඉජ්මා මුරක්කබ් ය. (5) ඉජ්මා කව්ලි ය.

**9.** නබි (සල්) තුමාගේ කාලයේ මුස්ලිම්වරු හිජ්රත් ගිය ප්‍රදේශ දෙක වන්නේ,
(1) මක්කාව හා මදීනාව ය. (2) තායිෆ් හා යත්රිබ් ය. (3) හබෂා හා යත්රිබ් ය.
(4) හුදයිබිය්‍යා සහ කයිබර් ය. (5) ෂාම් සහ ඉරාකය ය.

**10.** පහත ඒවායින් 'ෆර්ල් කිෆායා' **නො වන්නේ**
(1) වෛද්‍යවරයකු සිටීම ය. (2) සුදුසුකම් ලත් ආලිම්වරයකු සිටීම ය.
(3) ජනාසාවට අදාළ වගකීම් ඉටු කිරීම ය. (4) දිනපතා සලාතය ඉටු කරන ආබිද්වරයකු සිටීම ය.
(5) පොදු සෞඛ්‍ය පහසුකම් ඇති කිරීම ය.

**11.** 'තස්කියතුන් නෆ්ස්' යන්නෙන් දැක්වෙන්නේ,
(1) සිත සකසන කාර්යයයි. (2) සිරුර සකසන කාර්යයයි.
(3) ආත්මය සකසන කාර්යයයි. (4) තසව්වුෆ් ක්ෂේත්‍රය පුළුල් කිරීමයි.
(5) ජීවිතය සකස් කිරීමයි.

**12.** අල්ලාහ්ගේ ශුද්ධ වූ නම් අතුරින් 'අල් අහද්' යන්නෙන් දැක්වෙන්නේ, ඔහුගේ
(1) ඒකීයත්වයයි. (2) පරාර්ථකාමීත්වයයි. (3) හැකියාවයි. (4) අනුකම්පාවයි. (5) පාලන අධිකාරයයි.

**13.** පහත දැක්වෙන ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මුල්හිද් අල්ලාහ් පිළිගන්නා ය. මුෂ්රික් අල්ලාහ් ප්‍රතික්ෂේප කරන්නා ය.
(2) මුල්හිද් බුද්ධිමත් ය. මුෂ්රික් මෝඩ ය.
(3) මුල්හිද් අල්ලාහ් ප්‍රතික්ෂේප කරන්නා ය. මුෂ්රික් අල්ලාහ් පිළිගන්නා ය.
(4) මුල්හිද් අල්ලාහ් ප්‍රතික්ෂේප කරන්නා ය. මුෂ්රික් අල්ලාහ්ට සමාන කරන්නා ය.
(5) මුල්හිද් අලුතින් බිහි වූ තැනැත්තා ය. මුෂ්රික් පුරාණයේ සිට සිටින්නා ය.

**14.** කලීෆා උස්මාන් (රළි) තුමා 'ජාමි උල් කුර් ආන්' යනුවෙන් හැඳින්වීමට හේතුව,
(1) එතුමා සම්පූර්ණ අල්-කුර්ආනය ම වනපොත් කර තිබීම ය.
(2) කුත්තාබුල් වහීවරුන්ගෙන් කෙනකු වූ නිසා ය.
(3) අල්-කුර්ආනය ගොනු කිරීමේ කාර්යයේ යෙදුණු නිසා ය.
(4) අල්-කුර්ආනය මාර්ගයෙන් මුස්ලිම්වරු සමගි කිරීම නිසා ය.
(5) අල්-කුර්ආන්, මුස්අබ් උස්මානිය ප්‍රසිද්ධියට පත් කළ නිසා ය.

**15.** 'සහාබි' යන සුවිශේෂ නාමයෙන් හඳුන්වන්නේ,
(1) නබි (සල්) තුමාගේ කාලයේ ජීවත් වූ අය ය. (2) නබි (සල්) තුමා මුණ ගැසුණු මුස්ලිම්වරුන් ය.
(3) හිජ්රි ප්‍රථම අර්ධ ශතවර්ෂයේ ජීවත් වූවන් ය. (4) හිජ්රි අවසාන අර්ධ ශතවර්ෂයේ ජීවත් වූවන් ය.
(5) හිජ්රි පළමු ශතවර්ෂයේ ජීවත් වූ මුස්ලිම්වරුන් ය.

**16.** 'තර්තීබ් තිලාවත්' හා 'තර්තීබ් නුසූල්' මගින් පිළිවෙළින් දැක්වෙන්නේ, අල්-කුර්ආනය
(1) පහළ වූ ආකාරය හා පාරායනය කරන ආකාරයයි. (2) පාරායනය කරන ආකාරය හා පහළ වූ ආකාරයයි.
(3) පහළ වූ ආකාරය හා ලියන ලද ආකාරයයි. (4) ගොනු කළ ආකාරය හා පාරායනය කළ ආකාරයයි.
(5) සංවිධානය කර ඇති ආකාරය හා පාරායනය කරන ආකාරයයි.

**17.** හදීස් අතර ඉතා ඉහළ ම ශ්‍රේණියේ ලා සැලකෙනුයේ,
(1) 'මුතවාතිර්' ය. (2) 'සහීහ්' ය. (3) 'හසන්' ය. (4) 'මව්ලුආත්' ය. (5) 'මර්ෆූහ්' ය.

**18.** පහත සඳහන් ප්‍රකාශවලින් මදනි සූරා හා සම්බන්ධ ප්‍රකාශය තෝරන්න.
(1) කුඩා පරිච්ඡේද සහිත ය. (2) ශබ්ද රසය වැඩියෙන් දක්නට ලැබේ.
(3) වගකීම් හා නීති පිළිබඳව සඳහන් කරන ඒවා ය. (4) අකීදා පිළිබඳ ව පහදන ඒවා ය.
(5) හුරූෆුල් මුකද්දආ සහිත ඒවා ය.

**19.** ඉස්ලාමීය අකීදාවේ පාරිශුද්ධභාවය සුරැකීමට දායක වූ ඉමාම්වරයා,
(1) ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා ය. (2) ඉමාම් සුයූති (රහ්) තුමා ය.
(3) ඉමාම් දබරි (රහ්) තුමා ය. (4) ඉමාම් ඉබ්නු කසීර් (රහ්) තුමා ය.
(5) ඉමාම් අබුල් හසන් අල් අෂ්අරී (රහ්) තුමා ය.

**20.** අල්ලාහ්ගේ වාජිබ් වූ සිෆාත් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) වුජූදුන්, හයියුන්, ආලිමුන්, ජහ්ලුන් (2) හයාතුන්, මෞතුන්, කාදිරුන්, සම්උන්
(3) කිදමුන්, කාදිරුන්, සම්උන්, බසරුන් (4) ඉරාදතුන්, කුද්රතුන්, අජ්සුන්, බකමුන්
(5) ජහ්ලුන්, බකමුන්, අසම්මු, කියාමුහු බිනෆ්සිහි

- අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවලට අදාළ ව **X** හා **Y** යටතේ දී ඇති තොරතුරු කිසියම් ආකාරයකින් එකිනෙකට සම්බන්ධතාවක් දක්වයි. ඒ අනුව **Y** තීරුවේ ඇති ඒවා, **X** තීරුවේ ඇති ඒවා සමඟ නිවැරදි අනුපිළිවෙළින් ගළපා ඇති වරණය තෝරන්න.

**21.**

| X | Y |
|---|---|
| (i) අකීදා | A – සුහ්රි |
| (ii) හදීස් | B – අෂ් අරි |
| (iii) තබ්සීර් | C – ෂාෆිඊ |
| (iv) ෆික්හ් | D – දබරි |

(1) A B C D (2) B A D C (3) B C D A (4) B D A C (5) C D B A

**22.**

| X | Y |
|---|---|
| (i) ලයිලතුල් මිහ්රාජ් | A – ෂව්වාල් -01 |
| (ii) යව්මුල් අරෆා | B – මුහර්රම් - 10 |
| (iii) යව්මුල් ආෂුරා | C – දුල්හජ් - 09 |
| (iv) ඊදුල් ෆිත්ර් | D – රජබු - 27 |

(1) A B C D (2) B C D A (3) B D C A (4) C D B A (5) D, C , B, A

**23.**

| X | Y |
|---|---|
| (i) තව්රාත් | A – සුලයිමාන් (අලයි) |
| (ii) ජාලූත් | B – ඉබ්රාහීම් (අලයි) |
| (iii) බල්කීස් | C – දාවුද් (අලයි) |
| (iv) නුම්රූද් | D – මූසා (අලයි) |

(1) A B C D (2) B C D A (3) B D A C (4) D C A B (5) D C B A

**24.**

| X | Y |
|---|---|
| (i) රිලා | A – වකාලා |
| (ii) රිබා | B – තස්කියා |
| (iii) රහ්න් | C – කුල්ඌ |
| (iv) තලාක් | D – හරාම් |

(1) B D A C (2) B D C A (3) C A B D (4) D A C B (5) D B A C

[තුන්වැනි පිටුව බලන්න.

| | X | | Y |
|---|---|---|---|
| **25.** | (i) මුන්කම් | A – | වෙනස් කළ ඒවා |
| | (ii) මන්සූක් | B – | පහළ වීමට හේතුව |
| | (iii) සෆ්උල් මදානි | C – | පැහැදිලි වාක්‍යය |
| | (iv) සබබුන් නුසූල් | D – | සූරා ෆාතිහා |

(1) A B D C (2) A C B D (3) B A D C (4) B D A C (5) C A D B

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව ඉංග්‍රීසි අක්ෂර යටතේ දී ඇති කරුණු සැලකිල්ලට ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**26.** 'කුෆ්ර්' හා 'නිෆාක්' පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - අල්ලාහ් ප්‍රතික්ෂේප කිරීම
B - නිරයේ පහළ ම තට්ටුවේ ස්ථිරව රැඳීම
C - බොරුව, පොරොන්දු කඩ කිරීම, විශ්වාස කඩ කිරීම
D - අල්ලාහ්ගේ නීති ප්‍රතික්ෂේප කිරීම
E - වංකව කතා කිරීම
F - ඉස්ලාමයේ වගකීම ප්‍රතික්ෂේප කිරීම

ඉහත සඳහන් ඒවායින් කුෆ්රයට අදාළ ප්‍රකාශ වනුයේ මොනවා ද?

(1) A, B හා C (2) A, D හා F (3) B, C හා E (4) B, C හා F (5) B, E හා F

**27.** අල්ලාහ්ගේ නියෝජිතයා වශයෙන් මිනිසා ඉටු කළ යුතු ඉබාදත්, ඉමාරත් හා කිලාෆත් යන කාර්ය කිහිපයක් පහත දැක්වේ.

A - ස්වාභාවික සම්පත් සුරැකීම
B - අල්ලාහ්ගේ නීති ප්‍රතික්ෂේප කිරීම
C - සලාත වැනි අනිවාර්ය වගකීම් ඉටු කිරීම
D - මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
E - අවට පරිසරය සාරවත් කිරීම
F - දරුවන් විසින් දෙමව්පියන්ට ඉටු කළ යුතු යුතුකම්

මේවායින් ඉමාරත් කාර්ය වනුයේ,

(1) A හා B ය. (2) A හා E ය. (3) B හා D ය. (4) B හා F ය. (5) C හා D ය.

**28.** පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්න.

A - ඉස්ලාම් අල්ලාහ් විසින් පහළ කළ ජීවන ක්‍රමය වේ.
B - ඉස්ලාම් මෙලොව ජීවිතය අරමුණු කරගත් එකකි.
C - ඉස්ලාම් තව්හීද්, රිසාලත් හා මආද් යන පදනම් මුල්කර ගත් එකකි.
D - එහි පුද්ගල නිදහසට ඉඩ නැත.
E - එය ජීවිතයේ සියලු ම අංශවලට මග පෙන්වයි.
F - අනාථයින්ගේ ධනය උදුරා ගැනීම, මත්පැන් පානය කිරීම වැනි ඒවා මහා පාප ලෙස නොසැලකේ.

ඉහත දැක්වෙන ඒවායින් ඉස්ලාම් ධර්මයේ සුවිශේෂ ලක්ෂණ වන්නේ,

(1) A, B හා C ය. (2) A, C හා E ය. (3) A, D හා F ය. (4) B, C හා D ය. (5) B, D හා F ය.

**29.** පහත සඳහන් ප්‍රකාශ සැලකිල්ලට ගන්න.

A - ගාසාහි ඉපදුණේ ය.
B - 'ෆික්හුල් අක්බර්' නම් ග්‍රන්ථයේ කර්තෘවරයා ය.
C - උසූලුල් ෆික්හ් කලාවේ මූලිකයා ය.
D - 'ආලිමුල් කුරයිෂ්' යන සුවිශේෂ නම හිමි ය.
E - හනෆි මද්හබය ස්ථාපිත කළ පුද්ගලයා ය.
F - වැඩියෙන් ඉස්තිහ්සාන් භාවිත කළේ ය.

ඉහත ප්‍රකාශවලින් ඉමාම් ෂාෆිඊ (රහ්) හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,

(1) A, B හා D ය. (2) A, C හා D ය. (3) B, C හා F ය. (4) C, D හා E ය. (5) D, E හා F ය.

**30.** අරාබිවරු ශ්‍රී ලංකාව හා පැවති පැරණි සබඳතා පිළිබඳ කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - අග්‍රබෝධි රජුගේ දූත කණ්ඩායම මදීනාවට ගොස් ආපසු ඒම
B - ශ්‍රී ලංකාවේ රසකාරක සුලභව තිබීම
C - ආරක්ෂාකාරී වරාය තිබීම
D - බනූ හාසිම්වරු ශ්‍රී ලංකාවට පැමිණීම
E - ස්වදේශීය රජවරුන්ගේ සහාය ලැබීම
F - අරාබිවරුන්ගේ මුහුදු ගමන් මාර්ගයේ රැඳවුම් ස්ථානයක් වීම

ඉස්ලාම් බිහි වීමට පෙර සිට ම අරාබිවරුන් ශ්‍රී ලංකාව සමඟ සබඳතා පැවැත්වීමට හේතු වූ කරුණු වන්නේ,

(1) A, B, D හා E ය. (2) A, C, D හා F ය. (3) A, C, E හා F ය.
(4) B, C, E හා F ය. (5) C, D, E හා F ය.

- අංක **31** සිට **35** දක්වා ප්‍රශ්නවලට අදාළ ව දී ඇති වචන අතුරෙන් කිසියම් ආකාරයක සම්බන්ධතාවක් සහිත වචන යුගල දෙකක් ඇත. එවැනි සම්බන්ධතාවක් **නොමැති** ඉතිරි වචනය තෝරන්න.

**31.** (1) අස්මා (රළි) (2) ආයිෂා (රළි) (3) ෆාතිමා (රළි) (4) හසන් (රළි) (5) හුසයින් (රළි)

**32.** (1) ඉබ්රාහිම් (අලයි) (2) සුලයිමාන් (අලයි) (3) යූසුෆ් (අලයි) (4) හාජර් (5) බල්කීස්

**33.** (1) තහාවි (2) ෂාෆිඊ (3) හම්බලි (4) හම්මාත් (5) නුහ්මාන්

**34.** (1) සූරා කහෆ් (2) සූරා ෆාතිහා (3) සූරා බකරා (4) සූරා ෆලක් (5) සූරා නාස්

**35.** (1) ෆිත්අත් (2) මුතසිලා (3) ඉස්නා අෂරියියා (4) වාජිබ් (5) හරාම්

**36.** සුප්‍රසිද්ධ හදීස් කලා විද්වතුන් ලෙස දැක්විය හැක්කේ, ඉමාම්වරුන් වන,
(1) බුහාරී, මුස්ලිම්, නසාඊ සහ ඉබ්නු හජර් ය. (2) අබූ දාවූද්, සුයූති, තිර්මිදි සහ ඉබ්නුල් කයියුම් ය.
(3) බුහාරී, මුස්ලිම්, තිර්මිදි සහ අබූ දාවූද් ය. (4) බුහාරී, මුස්ලිම්, අබූ දාවූද් සහ ගස්සාලි ය.
(5) නසාඊ, සුයූති, නවවි සහ තිර්මිදි ය.

**37.** විවාහ ගිවිසුම් නීත්‍යානුකූල ව ඉටු කිරීම සඳහා අවශ්‍ය 'ෂාහිද්' යනු,
(1) ගම්මුලාදෑනියා ය. (2) මනාලයාගේ පියා ය.
(3) නිකාහ් ලියාපදිංචි කරන්නා ය. (4) සාක්ෂිකරු ය.
(5) මස්ජිදයේ ඉමාම්වරයා ය.

**38.** ඉස්ලාමීය ඉතිහාසයේ බිහි වූ විවිධ මතවාදී කණ්ඩායම් අතුරෙන් 'කාරිජ්' යනු,
(1) අහ්ලුල් බයිත්වරුන්ට සහාය දැක්වූවන් ය. (2) කලීෆා උස්මාන් (රළි) තුමාට දොස් පැවරූ අය ය.
(3) ජමල් යුද්ධයට සහභාගී වූ අය ය. (4) අබූබක්කර් (රළි) තුමාගේ කාලයේ ආගම වෙනස් කළ අය ය.
(5) ෂිෆ්ෆීන් යුද්ධයේ දී මත ගැටුම් නිසා අලි (රළි) තුමාගේ පාර්ශ්වයෙන් ඉවත් වූ අය ය.

**39.** අයකු තම බිරිඳ ශාරීරික වශයෙන් තම මවට සමාන කිරීම නිසා ඇතිවන දික්කසාදය හඳුන්වනුයේ,
(1) 'ඊලාහ්' යනුවෙනි. (2) 'ෆාක්' යනුවෙනි. (3) 'ලිආන්' යනුවෙනි.
(4) 'ලිහාර්' යනුවෙනි. (5) 'ඛාඉන්' යනුවෙනි.

**40.** ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය පිළිබඳ ව වැදගත් තොරතුරු හෙළි කරන ග්‍රන්ථ වන්නේ,
(1) 'සහීහුල් බුහාරී' සහ 'රියාලුස් සාලිහීන්' ය. (2) 'අජාඉබුල් හින්ද්' සහ 'ෆුතූහුල් බුල්දාන්' ය.
(3) 'තාරීහුල් කබීර්' සහ 'තාරීහුර් රුසුල් වල් මුලූක්' ය. (4) 'කිතාබුල් උම්මු' සහ 'අහ්කාමුස් සුල්තානියා' ය.
(5) 'ෆුතූහුල් බුල්දාන්' සහ 'මිස්කාතුල් මසාබීහ්' ය.

- අංක **41** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙකක් බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2) , (3) , (4) , (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යෙදුම් යුගලය සහිත වරණය තෝරා, එහි **අංකය** පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| වරණ අංකය | පළමු යෙදුම | දෙවැනි යෙදුම |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | පළමු ප්‍රකාශය තවදුරටත් තහවුරු කරයි |

| | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **41.** | පිරිමින්ට පට හා රන් පැලඳීම තහනම් කර ඇත. | රන් හා පට කාන්තාවන්ට අනුමත ය. |
| **42.** | 'යා අයියුහන්නාස්' යැයි පවසනුයේ 'මදනි' වාක්‍යවල ය. | 'යා අයියුහල්ලදීනා ආමනූ' යැයි පවසනුයේ 'මක්කි' වාක්‍ය වේ. |
| **43.** | මුඃතසිලාවරු 'අහ්ලුද් තව්හීද් වල් අද්ල්' යැයි තමන් හඳුන්වා ගත්හ. | වාසිල් බින් අතා හසනුල් බසරි (රහ්) තුමා සමග වාද විවාද කළේ ය. |
| **44.** | ලෝක අවසානය සඳහා වන සියලු ම ලක්ෂණ සම්පූර්ණ වී ඇත. | ප්‍රධාන ඉබාදත් නොසලකා හැරිය ද කියාමාවේ දී විමුක්තියක් ඇත. |
| **45.** | හදීස්හි සැබෑ තත්ත්වය වටහා ගැනීමට 'මදන්' පමණක් නොසෑහේ. | 'අස්මා උර්රිජාල්' යනු හදීස්හි 'මදන්' පිළිබඳ ව විමසන කලාව වේ. |
| **46.** | 'අයියාමුත් තෂ්රීක්' දිනවල සව්ම් සමාදන් වීම 'හරාම්'වේ. | 'දුල්හජ්' මාසයේ 11, 12 සහ 13 යන දිනවල 'සව්ම්' සමාදන් වීම තහනම් ය. |
| **47.** | 'ඉජාරා' යන්නෙන් වෙළඳාමෙහි යහපත් ණය දැක්වේ. | 'සලම්' යනු වළක්වා ඇති වෙළෙඳ ක්‍රමයකි. |
| **48.** | ලිංගික සම්බන්ධයක් නොමැති ව තලාක් කීව ද ඉද්දා ඉටු කළ යුතු ය. | ගැබිණි මවකගේ සැමියා මළේ නම්, ඇය මාස හතරක් හා දින දහයක් ඉද්දා ඉටු කළ යුතු ය. |
| **49.** | කලීෆා අබූබක්කර් (රළි) තුමා තම අග්‍ර විනිශ්චයකාරවරයා ලෙස උමර් (රළි) තුමා පත් කර ගෙන තිබුණි. | උමර් රළිතුමා නිලධාරීන් අධීක්ෂණය කිරීම සඳහා මුහම්මද් බින් මස්ලමා (රළි) පත් කර ගෙන සිටියේ ය. |
| **50.** | යහපත් අරමුණක් උදෙසා හරාම් වූ කටයුත්තක් ඉටු කිරීම වරදක් නො වේ. | සියලු ක්‍රියා, සිතුවිලි අනුව තීරණය වේ. |

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | | |
|---|---|---|---|
| ඉස්ලාම් II<br>இஸ்லாம் II<br>Islam II | 44 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* |

**උපදෙස්:**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** මුස්ලිම් සමාජයීය ජීවිතයට පහත සඳහන් කරුණුවල වැදගත්කම දක්වන්න.
- (i) නබි (සල්) තුමාගේ මඟ පෙන්වීම
- (ii) නායකත්වය
- (iii) මස්ජිදය
- (iv) පවුල

**2.** පහත සඳහන් කරුණු පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
- (i) කත්මුන් නුබුව්වා
- (ii) තෆ්සීර් මහ්සූර්
- (iii) ඉද්දා
- (iv) අල්-උර්ෆු

**3.** නීති මූලාශ්‍ර පිළිබඳ පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (i) නබි (සල්) තුමාගේ ජීවිත කාලය තුළ අල්-කුර්ආනය ගොනු **නොකිරීමට** හේතු දක්වන්න.
- (ii) සහබාවරුන්ගේ කාලයේ අල්-කුර්ආනය ගොනු කිරීමට බලපෑමක් ඇතිවූ පසුබිම පැහැදිලි කරන්න.
- (iii) පසු කාලයේ හදීස් ගොනු කිරීමට හේතු වූ කරුණු දක්වන්න.
- (iv) නබි (සල්) තුමාගේ කාලයේ හදීස් ආරක්ෂා කරනු ලැබුවේ කෙසේ ද?

## II කොටස

**4.** (i) හජ්හි ඓතිහාසික වැදගත්කම දක්වන්න.
(ii) හජ් අන්තර් ජාතික සම්මේලනයක් බව ඔප්පු කරන්නේ කෙසේ ද?

**5.** ඉමාම් මාලික් (රහ්) තුමා පිළිබඳව පහත මාතෘකා යටතේ විස්තර කරන්න.
- (i) ඉමාම් මාලික් (රහ්) තුමාගේ සංක්ෂිප්ත ජීවිත කතාව
- (ii) නීති ක්ෂේත්‍රයට ඉමාම් මාලික් (රහ්) තුමාගේ දායකත්වය

**6.** (i) ඉබාදත් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිය පැහැදිලි කරන්න.
(ii) මුස්ලිම් ජනතාව අතර සදාචාරය ගොඩනැගීමට ඉස්ලාමයේ මූලික වගකීම් උදව් වන්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න.

**7.** (i) ඉස්ලාමීය ආර්ථික ව්‍යුහයේ දක්නට ඇති තහනම් කරන ලද ගනුදෙනු ක්‍රම පිළිබඳ ව විස්තර කරන්න.
(ii) දුප්පත්කම තුරන් කිරීමට ඉස්ලාම් ඉදිරිපත් කර ඇති විසඳුම් දක්වා, ඒවා දුප්පත්කම තුරන් කිරීමට දායක වන ආකාරය පැහැදිලි කරන්න.

**8.** පහත සඳහන් කරුණු පිළිබඳ ව විස්තර කරන්න.
- (i) මිනිස් ජීවිතය කෙරෙහි තව්හීද් ඇති කරන බලපෑම්
- (ii) අජ්නබි-මහ්රම් සීමා සුරැකීමේ අවශ්‍යතාව

***